# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/04/LH/07/ MODEL VILLAGE | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................................... | දිනය<br>திகதி<br>Date 2026.01.20 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක : 2026/04**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>අඩුආදායම්ලාභීන් සවිබලගැන්වීමේ නිෂ්පාදන ආදර්ශ ගම්මාන</u>**
**<u>(One Product -One Village) වැඩසටහන ක්‍රියාත්මක කිරීම- 2026</u>**

## 01.හැදින්වීම

සවිබලගැන්වීමේ කාර්යය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති අතර 2016 වර්ෂයේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහනෙන් ලද අත්දැකීම් පාදක කර ගනිමින් 2024 හා 2025 වර්ෂවලත් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.ඒ අනුව 2026 වර්ෂයේදීද මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.

01.මෙහිදී සමජාතීය නිෂ්පාදන සිදුකරන හෝ සිදුකිරීමට අපේක්ෂිත පවුල් කණ්ඩායම් ගත කරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීට නියමිත අතර **එක් ගමක් - එක් නිෂ්පාදනයක්** (**<u>One Product -One Village</u>**) සංකල්පය යොදා ගැනීමට නියමිතය.මෙම ව්‍යාපෘතියේදී ගම්මානය තුළ එක් නිෂ්පාදනයක් ප්‍රවර්ධනය කෙරේ.

02. දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නිෂ්පාදන ආදර්ශ ගම්මාන 89 ක් ආරම්භ කිරිමට සැලසුම් කර ඇත.එක් එක් දිස්ත්‍රික්ක මගින් 2026 වර්ෂයේදී දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කලයුතු නිෂ්පාදන ආදර්ශ ගම්මාන ප්‍රමාණය ඇමුණුම 01 මගින් දක්වා ඇත.

03.මෙම වැඩසටහන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

## 02. අරමුණු

01.ව්‍යාපෘතිලාභීන්ගේ මාසික ශුද්ධ ආදායම අවම වශයෙන් රු.40,000.00 දක්වා ඉහළ නැංවීම.

02.ගම්මානයේ පවතින සම්පත් සඳහා නිසි වෙළඳපල වටිනාකමක් ලබා දීම.

03.අපනයන අභිමුඛ හා ආනයන ආදේශක භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම.

04.වගා නොකළ ඉඩම්වල පවතින සම්පත් කෘෂි හා සත්ත්ව පාලන ව්‍යාපෘති සඳහා යොදා ගැනීම.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

05.කෘෂි සත්ත්ව පාලන ධීවර කර්මාන්ත හා සේවා යන ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘතීන් දිරිමත් කර එහි අගය එකතු කිරිම තුළින් වැඩි වටිනාකමක් ලබාදීම.

06.නිෂ්පාදනය සඳහා පවතින දේශිය හා විදේශිය අලෙවි වෙළඳපල අවස්ථා පුළුල් කිරිම සඳහා ඩිජිටල් වේදිකාව (Digital Platform) යොදා ගැනීම.

07.නව නිෂ්පාදන ආර්ථිකයන් හඳුන්වා දීම ( උදා: කෘෂි සංචාරක කර්මාන්තය විදේශීය සංචාරකයින් සඳහා cookery class පැවැත්වීම)

**03. ගම්මාන හඳුනාගැනීමේ නිර්නායක**

01.හඳුනා ගනු ලබන නිෂ්පාදන ආදර්ශ ගම්මානයේ, නිෂ්පාදනය / කර්මාන්ත හෝ සේවාව සඳහා විභවතාවයක් පැවතිය යුතු අතර එම ව්‍යාපෘති සමජාතීය විය යුතුය.

02.අපනයන විභවයක් හෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි නිෂ්පාදන කර්මාන්ත,නව නිෂ්පාදන ආදර්ශ ගම්මාන කෙරෙහි අවධානය යොමු කිරිම.

03. නිෂ්පාදන ආදර්ශ ගම්මානය ආරම්භ කිරිමෙන් පසුව ව්‍යාපෘතිලාභීන්ට තම නිෂ්පාදන කටයුතු ස්වාධිනව අඛණ්ඩව කරගෙන යාහැකි ව්‍යාපෘති විය යුතුය.

**04.සහභාගීවන්නන් හඳුනාගැනීම.**

01.2023 වර්ෂයේ ජුනි මසට අදාලව සමෘද්ධි සහනාධාර ලේඛණයේ නම් ඇතුළත්ව සිටි සමෘද්ධි සහනාධාරලාභීන් හා 2023 වර්ෂයේ ජුනි මස සිට අදාල මාසික සමෘද්ධි සහනාධාර හිමිව තිබූ වර්තමානයේ අස්වැසුම සහනාධාර ලැබෙන හෝ නොලැබෙන කාණ්ඩ දෙකෙන්ම ප්‍රතිලාභීන් මේ සඳහා තෝරා ගතයුතුය.

02. 2025 වර්ෂයේ පවුල් සංවර්ධන සැලැස්ම සකස් කර ඇති, මෙතෙක් කිසිදු ප්‍රතිලාභයක් නොලැබුණු ඉහත අංක 01 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රතිලාභීන් මෙම වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබා දිය හැකිය.

03.මේ වනවිට අස්වැසුම ලබන අයෙකු නම් අන්ත දුප්පත්, දුප්පත් හා අවදානමට ලක්වූ යන කාණ්ඩ තුනෙන්ම තෝරා ගැනීම කලහැකිය.

04.2024/2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ (අප දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රාජ්‍ය ආයතනයකින්) වැඩසටහනක් යටතේ ආධාර නොලැබූ පවුලක් විය යුතුය.

05.දැනටමත් නිෂ්පාදන කටයුතු වල යෙදී සිටින හෝ ඒ සඳහා විභවතාවක් / කුසලතාවයක් සහිත පුද්ගලයින් විය යුතුය.

06. විභවතාවක් සහිත කාන්තා මූලික,පවුල් හඳුනා ගැනීම කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

07.එක් ගම්මානයක් සඳහා උපරිම සාමාජික සංඛ්‍යාව 15-25 අතර විය යුතුය.

**05.ක්‍රියාත්මක ක්‍රමවේදය**

01. පවුල් සංවර්ධන සැලැස්ම තුළින් ව්‍යාපෘතිලාභීන් සඳහා සුදුසු ජීවනෝපාය මාර්ගය හඳුනාගැනීම සිදු කල පසුව එම සමජාතීය ව්‍යාපෘතීන් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කලයුතුය.

02.සමජාතීය නිෂ්පාදන සිදුකරනු ලබන පවුල් ඒකරාශි කරගත යුතුය. සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් අදාළ ග්‍රාම නිලධාරී වසමේ ව්‍යාපෘති සඳහා යෝජිත ප්‍රතිලාභීන් සමඟ සාකච්ඡා කර නිෂ්පාදනය කිරිමට අවශ්‍ය නිෂ්පාදනය තෝරා ගත යුතුය.

03. තෝරාගත් නිෂ්පාදන ආදර්ශ ගම්මාන සඳහා කෘෂි, පශු හෝ වෙනත් තාක්ෂණික සහය අවශ්‍ය නම් එය සැලසුම් කරන අවධියේදීම ඊට අදාල තාක්ෂණික නිලධාරීන්ගේ සහය ලබා ගත යුතුය.

04.එහිදී නිෂ්පාදන ආදර්ශ ගම්මානය ක්‍රියාත්මක කරන කාල රාමුව පිළිබඳ විශේෂ අවධානය යොමු කල යුතුය.

05.එසේම මෙම ව්‍යාපෘති වාර්තාවේ සඳහන් ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික දැණුම ඇති රාජ්‍ය ආයතනවල නිලධාරින්ගේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්යය වේ.

06. නිෂ්පාදන ආදර්ශ ගම්මාන සඳහා ඇමුණුම අංක 02 පරිදි ව්‍යාපෘති වාර්තාව සකස් කර අදාළ නිර්දේශයන් සහිතව ඉදිරිත් කල යුතුය.එක් ආදර්ශ ගම්මානයක් සඳහා එක් ව්‍යාපෘති වාර්තාවක් සකස් කල යුතුය.( සාමාජික සංඛ්‍යාව 15-25 අතර සංඛ්‍යාවක් සිටිය යුතු අතර එම සාමාජිකයින්ගේ නම ලිපිනය ජාතික හැඳුනුම්පත් අංකය,අස්වැසුම ප්‍රතිලාභ ඇත්නම් අස්වැසුම ගෘහ අංකය හා දුරකතන අංකය පැහැළිව සටහන් කර ලේඛනයක් ව්‍යාපෘති වාර්තාව සමග ඉදිරිපත් කලයුතු වේ.)

07.ආදර්ශ ගම්මාන ව්‍යාපෘති සහ පුද්ගලයන් හඳුනාගැනිම 2026.02.15 පෙර සිදුකළ යුතු අතර ඒ සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර අවසන් කර 2026.03.20 දිනට පෙර ජීවනෝපාය සංවර්ධන අංශය වෙත ලබා දීමට කටයුතු කළයුතුය.

08.මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලින් වන අතර සෑම ව්‍යාපෘතියක්ම සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩලය වෙත වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර අනුමත කර ගත යුතුය. එබැවින් අදාළ ආකෘතියට අනුව සියළු තොරතුරු අන්තර්ගතව නිවැරදි ව්‍යාපෘති යෝජනා ලබාදීම අත්‍යාවශ්‍ය වේ.

09. රක්ෂණ ආවරණය ලබා ගත හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී ව්‍යාපෘති රක්ෂණය කිරිම අනිවාර්යය වේ. උදා: සත්ව පාලන,  කෘෂි වගාවන්

**06.ප්‍රතිපාදන වෙන් කිරිම**

01.තෝරා ගනු ලබන එක් නිෂ්පාදන  ආදර්ශ ගම්මානයක් සඳහා හඳුනා ගනු ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන මුදල අනුමත කරනු ලැබේ.

02.ආදර්ශ ගම්මානයක උපරිම ව්‍යාපෘතිලාභීන් 15-25 දෙනෙකු සිටිය යුතු අතර එක් ව්‍යාපෘතිලාභියෙකු වෙනුවෙන් උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු.100000.00 වේ

03.ප්‍රතිලාභීදායකත්වය දෙපාර්තමේන්තු  දායකත්වයෙන් 50% ක් විය යුතු අතර එය ප්‍රාග්ධන වත්කම් ලෙස හා මූල්‍යාමය ලෙස විය හැකිය.

04. ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අනුමත කිරිමේදී දිස්ත්‍රික්ක වෙතින් ව්‍යාපෘති යෝජනා ලැබෙන අනුපිළිවෙල මත සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

05.ව්‍යාපෘතිය සඳහා උපරිම දෙපාර්තමේන්තු  දායකත්වය ලබා දෙන අතර කිසිඳු අවස්ථාවකදී ව්‍යාපෘතිලාභියා වෙත මුදල් ආධාර ලබා නොදිය යුතුය.

06. ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තු දායකත්වය සහ ප්‍රතිලාභි දායකත්වය ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී ව්‍යාපෘතිලාභියාට සමෘද්ධි ප්‍රජාමුල බැංකුව මඟින් ණය පහසුකම් ලබා ගැනීමට පහසුකම් සැලසිය යුතුය.

07.යම් නිෂ්පාදනයක් වැඩි දියුණු කිරිමට ප්‍රාග්ධන භාණ්ඩ වල අවශ්‍යතාවයක් ඇත්නම් ප්‍රතිලාභියාගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රාග්ධන උපකරණ ලබාදීම අත්‍යවශ වේ.ව්‍යාපෘතියට ඒකරාශිව සිටින සෑම ව්‍යාපාතිලාභියෙකුගේම ප්‍රයෝජනය සඳහා අත්‍යාවශ්‍ය පොදු යන්ත්‍ර සූත්‍ර වැනි යටිතල පහසුකම් සැපයීමට අවශ්‍යතාවක් ඇතිවිට ඒ සඳහා මෙම අරමුදල් ඉහත ලබාදී ඇති මුදල් සීමාවන් තුළ ලබා දීමට කටයුතු කල යුතුය.
08.සියළු ප්‍රසම්පාදන කටයුතු 2026 වර්ෂයේ 3 වන කාර්තුව වන විට අවසන් කලයුතු වේ.

09.රජයේ ප්‍රතිපාදන මඟින් ලබාදෙන යෙදවුම් තම නිෂ්පාදන කාර්යය සඳහා පමණක් යොදාගන්නා බවට අදාළ ව්‍යාපෘතිලාභියා තම කොට්ඨාශයේ ප්‍රාදේශීය  ලේකම් සමඟ ඇමුණුම 03 පරිදි ගිවිසුම් ගත විය යුතු වේ.

10. වෙන් කරන ප්‍රතිපාදන මුදල් හා  මුදල් රෙගුලාසි සම්බන්ධ චක්‍රලේඛ  උපදෙස් සහ මෙම චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරන ලෙස දන්වමි.

11. වර්ෂ අවසානයේ වියදම් වාර්තාව ජීවනෝපාය සංවර්ධන අංශයට ලිඛිතව ලබා දිය යුතුවේ.

**08.පරිපාලන වියදම් වෙන් කිරිම**

01.මෙම වැඩසටහන යටතේ පරිපාලන වියදම් ලෙස1.5% වෙන්කරනු ලබයි.එම මුදලින් 1% ප්‍රාදේශිය ලේකම් කාර්යාලයටද 0.3% දිස්ත්‍රික් ලේකම් කාර්යාලයටද 0.2% ප්‍රධාන කාර්යාලයටද වෙන් කර ඇත.

**09.අධීක්ෂණය මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය**

01. ආදර්ශ ගම්මාන සඳහා සකස් කරන ලද නිෂ්පාදන සැලැස්ම අදාල නිලධාරීන් මසකට වරක් ප්‍රගති සමාලෝචනය කල යුතු අතර එම ප්‍රගතිය ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කල යුතුය.

02.මූලස්ථාන කළමණාකරු ඇතුළු සමෘද්ධි ප්‍රජාමුල බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු, ,සමෘද්ධි ප්‍රජාමුල බැංකු සමිති කළමණාකරු, ව්‍යාපෘති සහකාර සමඟින් අදාළ වසම භාරව රාජකාරි කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ නිරන්තර අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.

03.ප්‍රජාමුල සංවිධාන නියෝජිතයන්ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගි කරවා ගත යුතුය.සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරය සකස් කල යුතුය.

04.දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මාසික ප්‍රගති සමාලෝචනය රැස්වීම් වලදී මෙම වැඩසටහනේ ප්‍රගති සමාලෝචනය කල යුතුය.

05.ව්‍යාපෘති ආරම්භ කළ පසුව ඇමුණුම් අංක 04 මගින් මාසික ප්‍රගතිය ලබාදීමටත් අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ප්‍රධාන කාර්යාලය ලබා දිය හැකි වන පරිදි ප්‍රගතිය යාවත්කාලීන කර තබා ගැනීමටත් කටයුතු කලයුතු වේ.

06.ව්‍යාපෘතිලාභීන් වෙත ලබා දෙන යෙදවුම් (ප්‍රාග්ධන භාණ්ඩ සතුන් රෝපන ද්‍රව්‍ය හා වෙනත් ) පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ සහය ඇතිව ව්‍යාපෘති කළමණාකරු විසින් පවත්වා ගෙන යායුතු වේ.

මෙම චක්‍රලේඛ පිළිබඳ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අදාළ නිලධාරීන් දැනුවත් කල යුතුවේ.

මෙම චක්‍රලේඛ පිළිබඳ වැඩිදුර විස්තර ජීවනෝපාය සංවර්ධන අංශයේ දුරකතන අංක 0112873801 හා jeevonopaya@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

මෙම වැඩසටහන සඳහා තෝරාගනු ලබන සහභාගීවන්නන්ගේ තොරතුරු ( ව්‍යාපෘති තෝරා ගැනීමේ සිට සියලුම තොරතුරු) ප්‍රජා සවිබලගැන්වීමේ කාර්යය කළමණාකරනය සඳහා සකස් කර ඇති Empower is (EIS) පරිඝණක මෘදුකාංගයට ඇතුළත් කළ යුතුය.

**සී.ඩී.කළුආරච්චි**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් :

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය කා.දැ.ස
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්( සැලසුම්) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කා.දැ.ස
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කා.දැ.ස
4. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කා.දැ.ස
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කා.දැ.ස
6. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කා.දැ.ස